lkgazette.lk

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

පොල් වගාකිරීමේ මණ්ඩලය

තනතුරු පුරප්පාඩු - 2026

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන් (වතු) සේවාවේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. තනතුර: නීති නිලධාරී (ආ.පො.උ) (MM 1-1)

සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

නීතිය පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ වෘත්තීය සුදුසුකම් ලබා ඇති රජයේ නීතිඥයකු වීම

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, සංස්ථා, මණ්ඩල හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් කාණ්ඩය : MM 1-1

වැටුප් පරිමාණය : රු.91,690/- (10 X 2480) (15 X 3,450) 168,240/-

01/2025 චක්‍රලේඛ අනුව වැටුප් ගෙවන ආකාරය

2026.01.01 දිනට	2027.01.01 දිනට
රු. 81,710/-	රු.91,690/-

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

2. තනතුර: ක්ෂේත්‍ර නිලධාරී (ආ.පො.උ) (MA 2-3)

සේවා ස්ථානය : දිවයිනපුරා

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

අ.පො.ස උසස් පෙළ විභාගයෙන් අවම වශයෙන් විෂයන් දෙකක්

සමඟ

කෘෂිකර්ම / වැවිලි කළමනාකරණ / කෘෂි ව්‍යාපාර කළමනාකරණ විෂය සහිතව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

තනතුරට විශේෂිත වෙනත් සුදුසුකම්

- මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ යතුරුපැදි පැදවීම පිළිබඳව වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම
- පරිගණක භාවිත හැකියාව ලබා තිබීම
- මව් භාෂාවට අමතරව වෙනත් භාෂාවක් පිළිබඳ දැනුම තිබීම

වැටුප් කාණ්ඩය : MA 2-3

වැටුප් පරිමාණය : රු. 52,700/- (10X800)(11X1190) (10X1320)(10X1,350) රු.100,490/-

01/2025 චක්‍රලේඛ අනුව වැටුප් ගෙවන ආකාරය

2026.01.01 දිනට	2027.01.01 දිනට
රු. 48,784/-	රු. 52,700/-

වයස : අවුරුදු 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

3. තනතුර:කළමනාකරණ සහකාර (ආ.පො.උ) (MA 1-1)

සේවා ස්ථානය : දිවයිනපුරා

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල/ දෙමළ
ii. ගණිතය
iii. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී එකවර අවම වශයෙන් විෂයයන් තුන (03) ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) තනතුරට අදාළ වෙනත් විශේෂිත සුදුසුකම්:-

Ms.office භාවිතය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා NVQ 4 මට්ටමේ නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

වැටුප් කාණ්ඩය : MA 1-1

වැටුප් පරිමාණය : රු.46,220/- (10X540)(7X630) (4X890) (20X1,190) රු.83,390/-

01/2025 චක්‍රලේඛ අනුව වැටුප් ගෙවන ආකාරය

2026.01.01 දිනට	2027.01.01 දිනට
රු. 43,312/-	රු. 46,220/-

වයස : අවු : 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

ප්‍රාථමික (PL-3) - ශිල්පීය සේවා ගණයට අයත් තනතුරු:

4. ක්ෂේත්‍ර සහයක (ආ.පො.උ) (PL-3)

සේවා ස්ථානය : දිවයිනපුරා

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත් වීම.

සහ

වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) හතර (4) වැනි මට්ටමේ අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

5. තනතුර: බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු (ආ.පො.උ) (PL-3)

සේවා ස්ථානය : දිවයිනපුරා

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත් වීම.

සහ

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ වලංගු බලපත්‍රයක් හා බැකෝ යන්ත්‍ර ක්‍රියාකරවීමට ප්‍රවීණතාවය සහිතව තිබීම

සහ

NVQ-04 බැකෝ යන්ත්‍ර ක්‍රියාකිරීම පිළිබඳව නිපුණතාවය සඳහා සහතිකයක් ලබා තිබීම.

6. තනතුර: රියැදුරු (ආ.පො.උ) (PL-3)

සේවා ස්ථානය : දිවයිනපුරා

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත් වීම.

සහ

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් හා සිව්රෝද ට්‍රැක්ටර් පැදවීමේ වලංගු බලපත්‍රයක් ලබා තිබීම

සහ

රියැදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් කාණ්ඩය : (PL-3)

වැටුප් පරිමාණය : රු. 43,280/- (10X490) (10X540) (10X590)(12X630) 67,040/-)

01/2025 චක්‍රලේඛ අනුව වැටුප් ගෙවන ආකාරය

2026.01.01 දිනට	2027.01.01 දිනට
රු. 40,834/-	රු. 43,280/-

වයස : අවු : 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

- උක්ත සියලුම තනතුරු සඳහා ජීවන වියදම් දීමනාව රු.17,800 ඇතුළු රජයේ අනෙකුත් දීමනා

බඳවාගැනීමේ ක්‍රමවේදය :

ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි පුවත්පත් දැන්වීමකින් හෝ ප්‍රසිද්ධ දැන්වීමකින් ඉල්ලුම්පත් කැඳවා ලිඛිත තරඟ විභාගයක හා/ හෝ පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

වෙනත් කොන්දේසි :

සෑම ඉල්ලුම්කරුවෙක් ම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

අයදුම්පත් :

- ඒ අනුව 2026.11.13 දිනට අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහත වෙබ් අඩවියේ ඇති ආදර්ශ ආකෘතියට අනුව හෝ තමන් විසින් සකස් කර ගත් ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමුකළ යුතුවේ. එමෙන්ම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කළ හැකි සහතිකවල සහතික කළ පිටපත් සමග අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේ යොමු නොකරන අයදුම්පත්| ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.
- අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. එසේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේනම් එක තනතුරකට එක බැගින් වන සේ අයදුම්පත්‍ර වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතු වේ.
- එමෙන්ම මෙම සම්මුඛ පරීක්ෂණ සම්බන්ධයෙන් ඔබ විසින් යම් බලපෑමක් සිදුකරනු ලැබුවහොත් එය තනතුරට බඳවා ගැනීමේ නුසුදුසුකමක් සේ සලකනු ලබන බවද වැඩි දුරටත් දන්වා සිටිමි.
- සියලුම අයදුම්පත් 2026.11.13 දින හෝ එදිනට පෙර ලැබෙන සේ "සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

සභාපති,
පොල් වගාකිරීමේ මණ්ඩලය,
9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

ඉහත තනතුරු සඳහා අදාළ අයදුම්පත්‍රය පහත වෙබ් අඩවියෙන් බාගත කර ගන්නා ලෙස දන්වමි. එමෙන්ම එසේ බාගත කරගැනීමේ යම් අපහසුතාවයක් ඇති වුවහොත් තමන් විසින් සකස් කර ගත් ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමුකරන ලෙස දන්වමි.
https://coconutsrilanka.lk/